විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2019

මාගේ අංක විවැ/චක්‍රලේඛ 2019
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2019.06.11

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>2019 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට විශ්‍රාම වැටුප් ගැලපීම</u>**

රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2017/01/01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගනු ලැබූ සියලුම රාජ්‍ය නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමට නිකුත් කළ 2019.05.31 දිනැති අංක 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු උපදෙස් මාලාව මේ සමඟ අමුණා ඇත. ඒ අනුව, විශ්‍රාම වැටුප් ගැලපීම කඩිනමින් සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

ජ්.ජගත් ඩී.ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - කාරුණික දැන ගැනීම සඳහා |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - කාරුණික දැන ගැනීම සඳහා |
| 3. | ලේකම්, රාජ්‍ය පරිපාලන, හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | - කාරුණික දැන ගැනීම සඳහා |
| 4. | ලේකම්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | - කාරුණික දැන ගැනීම සඳහා |
| 5. | ලේකම්, මුදල් අමාත්‍යාංශය | - කාරුණික දැන ගැනීම සඳහා |
| 6. | විගණකාධිපති | - අ.ක.ස |

# රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2019 ට අනුව විශ්‍රාම වැටුප් ගැලපීම 2019 : උපදෙස්

2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ලැබූ රජයේ නිලධාරීන් වෙනුවෙන් ගෙවනු ලබන විශ්‍රාම වැටුප රාජ්‍ය සේවයේ වැටුප් ප්‍රතිශෝධනය කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි 2017.01.01 දිනට හිමිවිය යුතු වැටුප පදනම් කර ගනිමින් ගැලපීමට රජය තීරණය කර ඇත. ඒ සඳහා නිකුත් කළ අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සමගාමීව මෙම උපදෙස් නිකුත් කෙරේ.

1. මෙම වැටුප් ගැලපීම 2019.07.01 දින සිට ක්‍රියාත්මකය.

2. 2017.01.01 දින හෝ ඊට පෙර විශ්‍රාම ගොස් හෝ එදිනට පෙර සේවයේ යෙදී සිටියදී මියගිය හෝ විශ්‍රාම ගොස් සිටියදී මියගිය රජයේ සේවකයින් හෝ වැන්දඹු/ වැන්දඹු පුරුෂ, අනත්දරු, ආබාධිත විශ්‍රාම වැටුපකට හිමිකමක් ඇති 2019.07.01 දිනට විශ්‍රාම වැටුප් ලබමින් සිටින ප්‍රතිලාභීන්ට මෙම සංශෝධනය යටතේ ප්‍රතිලාභ හිමි වේ.

3. විශ්‍රාම වැටුප් සංශෝධනයට අදාළව තනතුරු උපලේඛණය හා වැටුප් පරිවර්තන වගුව 2019.05.31 දිනැති හා අංක 14/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ඇමුණුම් ලෙස ඇතුළත් කර ඇත.

4. 2019.07.01 දින සිට මෙම ගැලපීමත් සමඟ මෙතෙක් අයවැය යෝජනා අනුව මාසිකව ගෙවනු ලැබූ රු.3,500ක දීමනාව නතර කළ යුතුය.

5. 2019.07.01 දින සිට මෙම සියලුම විශ්‍රාමිකයින්ට රු.3,525ක් වන ජීවන වියදම් දීමනාව තවදුරටත් ගෙවීමට කටයුතු කළ යුතුය. විදේශගතව සිටින විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 1/2018 හි විධිවිධාන ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක විය යුතුය.

6. විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා නිලධාරියා සේවය කරනු ලැබූ සේවා කාලය අදාළ කර ගත යුතුය.

7. විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා 2016.04.27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2016 හි 2017 වර්ෂයට අදාළ ප්‍රතිශත වගුව භාවිතා කළ යුතුය.

8. මෙම විශ්‍රාම වැටුප් ගැලපීමට පදනම් වන්නේ විශ්‍රාම ගිය දිනට පෙර දිනය, සේවයේ යෙදී සිටියදී මිය ගිය දිනය, නැවත සේවයේ යෙදී සිට නැවත සේවයෙන් විශ්‍රාම ගිය/ ඉවත් වූ දිනට පෙර දිනය හෝ අවසන් වරට රාජ්‍ය සේවයේ සිටි දිනය සහ එදිනට ලැබූ වාර්ෂික ඒකාබද්ධ වැටුප වේ.

9. දැනට ගෙවනු ලබන වැටුප් නිවැරදි බවට තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් සංශෝධනය කළ යුතුය. මේ සඳහා විශ්‍රාම වැටුප් ලිපිගොනුව භාවිතා කළ යුතු අතර, විශ්‍රාම වැටුප් ලිපි ගොනුවක් නොමැති නම් ඒ සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2001 මඟින් මීට පෙර ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.

10. **විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා, ලබා දී ඇති තොරතුරු තාක්ෂණ පද්ධතිය භාවිතා කළ යුතු අතර එමඟින් ලබා ගන්නා මුද්‍රිත පිටපත අදාළ නිලධාරීන් විසින් අනුමත කළ පසු විගණනයේ පහසුව සඳහා විශ්‍රාම වැටුප් ගොනුවට ඇතුළත් කළ යුතුය. මෙලෙස අනුමත කරනු ලබන මුද්‍රිත පිටපත පරිලෝකනය කර දත්ත පද්ධතියේ අදාළ ස්ථානයට අමුණා තිබිය යුතුය. දත්ත පද්ධතිය මඟින් අදාළ ගණනය කිරීම් සිදුවන බැවින් නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට ඔබ විසින් විශ්‍රාමිකයාගේ තොරතුරු ඇතුළත් කිරීමේදී නිවැරදි දත්ත (විශේෂයෙන්ම දින) ඇතුළත් කළ යුතුය.**

11. විශ්‍රාම වැටුප සකස් කිරීමේ දී විශ්‍රාම වැටුප් සහිත දීමනා සහ උපයාගත් වැටුප් වර්ධක එකතු කර ගණනය කර ඇති විට අදාළ වැටුප් පරිමාණය සෙවීමේ දී එම දීමනා සහ උපයාගත් වැටුප් වර්ධක කොටස අඩුකර වැටුප් පියවර ලබා ගත යුතුය. එමඟින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා 2017 වසරට අනුරූප වැටුප ලබාගත් පසු විශ්‍රාම වැටුප් සහිත දීමනා පමණක් එම වැටුපට එකතු කර සංශෝධිත විශ්‍රාම වැටුප ගණනය කළ යුතුය.

12. **එසේ ගණනය කළ අඩු කළ හා අඩු නොකළ විශ්‍රාම වැටුප නව සංශෝධිත විශ්‍රාම වැටුප වන අතර විශ්‍රාම වැටුප් ගණනයට අදාළව විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක් හිමි නොවේ.**

13. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ අංක 5/2015 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව විශ්‍රාම වැටුප් ගැලපීම සිදු කර ඇත යන උපකල්පනය මත වන අතර එම සංශෝධනයේදී යම් විශ්‍රාම වැටුපක් පවත්නා ගැටළුවක් මත මේ දක්වා සංශෝධනය කර නොමැති නම් ඒ සඳහා තවදුරටත් ඒ සම්බන්ධව නිකුත් කරන ලද චක්‍රලේඛ හා උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

14. එහෙත් සංශෝධිත විශ්‍රාම වැටුප අඩුවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 5/2015 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධන කර නොමැති නම් එම අයගේ විශ්‍රාම වැටුප මෙම අවස්ථාවේදී සංශෝධනය කිරීමට පියවර ගත යුතුය.

15. විශ්‍රාම වැටුප් ගණනයට යොදා නොගන්නා දීමනා (උදාහරණයක් වශයෙන් යහපත් සේවා දීමනාව) ගෙවා ඇත්නම් ගැලපීම කළ විශ්‍රාම වැටුප සමඟ තවදුරටත් හිමි ගැන්විය යුතුය.

16. නැවත විවාහ වූ වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප්ලාභීන්ට මෙම සංශෝධිත මූලික විශ්‍රාම වැටුපෙන් 50% සහ දීමනාවලින් 50% ක් හිමිය. ජීවන වියදම් දීමනාව ගැලපීමට යටත් විය යුතුය. මෙම විශ්‍රාම වැටුප් අංක සඳහා 2019.07.01දින සිට පහත සඳහන් වර්ග සංකේත අංකය භාවිතා කළ යුතුය. ඒ අනුව දැනට ගෙවන විශ්‍රාම වැටුප් අංක දත්ත මූලයේ නිවැරදි කළ යුතුය.

    නැවත විවාහ හමුදා වැන්දඹු - 60
    නැවත විවාහ සිවිල් වැන්දඹු - 61
    නැවත විවාහ සිවිල් වැන්දඹු පුරුෂ - 62
    නැවත විවාහ හමුදා වැන්දඹු පුරුෂ - 63

17. බෙදීයන විශ්‍රාම වැටුප් සඳහා සංශෝධිත නව මූලික විශ්‍රාම වැටුප 2019.07.01 දිනය පදනම් කර ගෙන ගෙවිය යුතු අතර එකම ගොනුවක් මඟින් මෙම සංශෝධනය සිදු විය යුතුය.

18. විශ්‍රාම වැටුප් පරිවර්තනයට අදාළ කරගත යුතු විශ්‍රාම වැටුප් වර්ග සංකේත අංකයන් ඇමුණුම 01 ලෙස දක්වා ඇත.

19. යම් විශ්‍රාමිකයෙකු වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වෙත පදිංචිය වෙනස් කර ඇත්නම් මධ්‍යම දත්ත පද්ධතිය හරහා විශ්‍රාම වැටුප් ලිපිගොනුව ද විශ්‍රාමිකයා පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යැවීමට කටයුතු කිරීමෙන් පසුව පමණක් ගැලපීම සිදුකළ යුතුය.

20. **විෂමතා ඉවත් කිරීමට අදාළ තොරතුරු පරිගණක ගත කළ පසු ගෙවීම් නිවැරදි බව නිර්දේශ කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරි හෝ බලය පවරා ඇති විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සිදු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය පහසුකම් තොරතුරු තාක්ෂණ පද්ධතියේ සලසා ඇත. 2006.01.01ට පෙර විශ්‍රාම ගිය විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් පරිවර්තනයේ නිරවද්‍යතාවය සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 05/2015 අනුව විශ්‍රාම වැටුප් පරිවර්තනය නිවැරදිව සිදුවී තිබිය යුතු බැවින් ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.**

21. තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී වැටුප් තලය, ශ්‍රේණිය, අනුරූපි වැටුප, විශ්‍රාම ගත් දිනය, වැටුප් වර්ධක දිනය, සේවා කාලය හා වැටුප් රහිත සේවා කාලය නිවැරදිව ඇතුලත් කර තිබේද යන්න තහවුරු කළ යුතුය.

22. ලිපි ගොනු ලබා ගැනීම, ගොනුව මඟින් තොරතුරු ලබා ගැනීම, සංශෝධිත වැටුපෙහි පිහිටුවීම, පරීක්ෂා කිරීම, පරිගණක ගත කිරීම සිදු කරනු ලබන කාර්යය මණ්ඩලය එම කාර්යයන් පිළිබඳව වාර්තාවක් තබා ගැනීමට කටයුතු කළ යුතුය.

23. හිමි වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස විශ්‍රාම වැටුප් හිමිගන්වා ඇති වැන්දඹු/ වැන්දඹු පුරුෂ, අනත්දරු, ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් සඳහා පළමුව අදාළ වැටුපෙහි පිහිටුවා පසුව හිමි ප්‍රතිශතය මත සංශෝධනය කල යුතුය. සේවයේ යෙදී සිටියදී මිය ගිය නිලධාරීන්ගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 7/2000 අනුව සිදු කළ යුතුය.

24. ජීවිත සහතික ලබා දී ඇති විශ්‍රාමිකයින්ට පමණක් සංශෝධනය හිමි වේ. නතර කර ඇති විශ්‍රාම වැටුප්ලාභීන්ටද හිමි නොවේ.

25. විශ්‍රාම ගන්නා දිනය හා ගෙවීම් ආරම්භක දිනය වෙනස් වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 හා 30/88 සම්බන්ධයෙන් වන විධිවිධාන පිළිබඳව මෙම විශ්‍රාම වැටුප් පරිවර්තනයේදී විශේෂයෙන් අවධානය යොමුකර කටයුතු කළ යුතුය.

26. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/88 යටතේ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම ගත් දිනය ලෙස විශ්‍රාම වැටුප බලාත්මක වන දිනය ඇතුලත් කළ යුතුය.

27. **SL 3 වැටුප් කාණ්ඩයේ හා ඉන් ඉහළ වැටුප් කාණ්ඩයන්හි සිටින සියළු විශ්‍රාමිකයින්ගේ තොරතුරු අනිවාර්යයෙන්ම ප්‍රදාන පත්‍රයේ සඳහන් ආකාරයටම පද්ධතියට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය.**

28. විශ්‍රාම වැටුප් පරිවර්තනයට ඉදිරිපත් වන 'ට' උපලේඛණයට අදාළ විශ්‍රාමිකයන්ගේ ලේඛණයක් සකසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය.

29. මෙම විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සිදු කිරීමේදී, විශ්‍රාමික නිලධරයින් ලබාගත් පාරිතෝෂිකය වෙනුවෙන් දැනට ඔවුන්ගෙන් මාසිකව අයකර ගන්නා මුදලෙහි කිසිදු වෙනසක් සිදු නොවිය යුතු අතර එම මුදලම ප්‍රතිශෝධිත විශ්‍රාම වැටුපෙන් අයකර ගත යුතුය. ප්‍රතිශෝධිත වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස අඩු කළ යුතු මුදල ගණනය නොකළ යුතුය.

30. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2019 හි 06 වන වගන්තිය සඳහන් ආකාරයට අඩු කළ හා අඩු නොකළ විශ්‍රාම වැටුප් ගණනය කිරීම ලබා දී ඇති තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් සිදු වේ.

31. මෙම විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සියලු විශ්‍රාමිකයින් සඳහා 2019 ජූලි මස ලබා දීමට රජය තීරණය ඇති බැවින් ඒ සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කළ යුතුය.

# විශ්‍රාම වැටුප් වර්ග සංකේත අංක


| | |
|---|---|
| 1 | සිවිල් විශ්‍රාම වැටුප් |
| 2 | ගුරු (පෞද්ගලික පාසල්, පිරිවෙන්) |
| 3 | සන්නද්ධ සේවා විශ්‍රාම වැටුප් |
| 13 | පළාත් පාලන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් |
| 14 | පළාත් පාලන වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් |
| 15 | පළාත් පරිපාලන සේවා විශ්‍රාම වැටුප් |
| 21 | වැන්දඹු විශ්‍රාම වැටුප් |
| 22 | වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් |
| 23 | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් |
| 24 | වැන්දඹු ආබාධිත විශ්‍රාම වැටුප් |
| 25 | වැන්දඹු භාරකරු විශ්‍රාම වැටුප් |
| 27 | වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් |
| 28 | වැන්දඹු පුරුෂ ආබාධිත විශ්‍රාම වැටුප් |
| 31 | ගුරු වැන්දඹු විශ්‍රාම වැටුප් |
| 32 | ගුරු අනත්දරු විශ්‍රාම වැටුප් |
| 33 | ගුරු ආබාධිත විශ්‍රාම වැටුප් |
| 40 | සන්නද්ධ සේවා වැන්දඹු විශ්‍රාම වැටුප් |
| 41 | සන්නද්ධ සේවා අනත්දරු විශ්‍රාම වැටුප් |
| 43 | සන්නද්ධ සේවා භාරකරු විශ්‍රාම වැටුප් |
| 44 | සන්නද්ධ සේවා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් |
| 45 | සන්නද්ධ සේවා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් |
| 60 | නැවත විවාහ හමුදා වැන්දඹු |
| 61 | නැවත විවාහ සිවිල් වැන්දඹු |
| 62 | නැවත විවාහ සිවිල් වැන්දඹු පුරුෂ |
| 63 | නැවත විවාහ හමුදා වැන්දඹු පුරුෂ |
| 68 | අවු.55 සම්පූර්ණ වූ අවු.10ට අඩු සේවා විශ්‍රාම වැටුප් - පොලිස් |
| 69 | අවු.55 සම්පූර්ණ වූ අවු.10ට අඩු සේවා විශ්‍රාම වැටුප් - ත්‍රිවිධ හමුදා |

# 2019 විශ්‍රාම වැටුප් පරිවර්තනය ක්‍රියාත්මක කිරීමේ මාර්ගගත පද්ධතිය (Pension Revision System)

2019 අයවැය අනුව ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් සංශෝධනයට අදාළව,

## 01. PMS -01 පද්ධතියෙහි Revision System සඳහා පිවිසුම :

1. ඔබගේ පරිගණකයෙහි ඇති **Google Chrome** Icon මත click කිරීම.
2. එහි address bar එක මත http://sathkara.pensions.gov.lk/pms Type කිරීම සහ Enter button click කරන්න.
   - නැතහොත් address bar එක මත www.pensions.gov.lk ලෙස Type කිරීම මඟින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත පිවිස එහි පහතින් දැක්වෙන interface හි ඇති PENSION MANAGEMENT SYSTEM යන Icon එක මත click කරන්න.
   - මෙහි වීඩියෝව ලබා ගැනීම සඳහා https://youtu.be/gd09UWz8qOY වෙත පිවිසෙන්න.




*රූපය 01:www.pensions.gov.lk*

මෙම පද්ධතිය 2019 අයවැය මඟින් ලබා දී ඇති විශ්‍රාම වැටුප් වැඩි කිරීම අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම සඳහා භාවිතා වේ.


**භාවිත කරන නිලධාරීන් පහත පරිදි කාණ්ඩ ගත කළ හැක.**

- **කාණ්ඩ A** - ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්යයේ නියුතු විශ්‍රාම වැටුප් නිලධාරින්, සංවර්ධන නිලධාරීන්, ලේඛන සහකාර හා විශ්‍රාම වැටුප් විෂයට අදාලව රාජකාරි කරන නිලධාරින්.

- **කාණ්ඩ B** - ගණකාධිකාරි, සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් විසින් විශ්‍රාම වැටුප් පරිවර්තනයක් අනුමත කිරීමට නිසි බලය පවරා ඇති නිලධාරීන්.


**පද්ධතිය භාවිතා කිරීමට පරිශීලක ගිණුම් සකස් කර ගැනීම.**

- **A කාණ්ඩය** - දැනට දුම්රිය බලපත්‍ර ලබා ගැනීමට භාවිතා කරන පරිශීලක ගිණුම් හරහාම පද්ධතියට පිවිසිය යුතුය.
- **B කාණ්ඩය** - දැනට පරිශීලක ගිණුම් සකස් කර ගෙන ඇති නිලධාරීන් එම ගිණුම් හරහා පද්ධතියට පිවිසිය යුතු අතර අනෙකුත් නිලධාරීන් නව පරිශීලක ගිණුමක් සකස් කර ගත යුතු වේ.





*රූපය 01.1: භාවිත ගිණුම හරහා පද්ධතියට පිවිසීම*

එසේ පරිශීලක ගිණුම් සාදා නොගත් නිලධාරීන් පහත ආකාරයට ගිණුමක් අලුතින් සකස් කර ගන්න





*රූපය 01.2:login පිටුව*

- එවිට පහත දැක්වෙන පරිදි drop down මෙනුවක් දැකිය හැකි වේ.
- එහි පහත දැක්වෙන තොරතුරු ලබා දෙන්න.




රූපය 01.3:ආයතන වර්ගය තේරීම


ඔබගේ ආයතනය PMS හි මේ වන විට ලියාපදිංචි වී ඇත්නම් "Office name"ක්ෂේත්‍රයෙහි ආයතනයේ නම පෙන්නුම් කරනු ඇත.එවිට ඊළඟ පියවර වන භාවිත ගිණුම "User Account" සැකසීම සඳහා "proceed" බටනය මත "click" කරන්න




රූපය 01.4:ආයතනයේ තොරතුරු මෙනුවෙන් තේරීම


## 02.හාවිත ගිණුම හරහා පද්ධතිය අභ්‍යන්තරය පිවිසීම :

- **පහත ආකාරයට REVISION පද්ධතිය මත CLICK කර පද්ධතිය වෙත පිවිසෙන්න.**




*රූපය 02: පද්ධතියට පිවිසීම*

ඔබ විසින් සකස් කරන ලද හාවිත ගිණුම (User Account) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි බව තහවුරු කළ පසු සකස් කළ User Name සහ Passwordමේ සඳහා හාවිතා කර log විය හැක.





*රූපය 02.1: හාවිත ගිණුම හරහා පද්ධතියට පිවිසීම*

ඉන්පසු ඔබ පිවිසෙන්නේ පහත ආකාරයේ මුල් පිටුවකටය.




*රූපය 02.2: Revision පද්ධතියේ මුල් පිටුවට පිවිසීම*


එහි PD6 Revision මෙනුව මත Click කර ඉන් අනතුරුව එහි දිස්වන New Revision මත Click කරන්න. එවිට ඔබ පහත දැක්වෙන අතුරු මුහුණතට පිවිසෙනු ඇත.




*රූපය 02.3 : Revision පද්ධතියේ මුල් පිටුව*

- මෙහි PD6 Revision මත Click කළ පසු ඔබට විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීමේ පද්ධතියේ විශ්‍රාමිකයාගේ මූලික තොරතුරු සෙවීමේ පිටුවට පිවිසීමට හැකිය.

## 03.A බණ්ඩයේ නිලධාරින් සඳහා පද්ධතිය භාවිතයට උපදෙස්:





*රූපය 03 : විශ්‍රාමිකයාගේ මූලික තොරතුරු සෙවීම*

**01.** ඉහත පරිදි "Search Pensioner" මත අදාල විශ්‍රාමිකයාගේ හැඳුනුම්පත් අංකය ඇතුලත් කර "Search" බටනය මත Click කරන්න. එවිට පහත පරිදි විශ්‍රාමිකයාගේ මූලික තොරතුරු ඔබට දිස්වනු ඇත.

පහත හේතුන් මත ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කළ නමුත් අදාල විශ්‍රාමිකයාගේ තොරතුරු දිස් නොවිය හැක.


- එම හැඳුනුම්පත් අංකයට අදාලව විශ්‍රාමිකයෙකු නොමැති වීම.
- හැඳුනුම්පත් අංකය නිවැරදි නොවීම.
- මධ්‍යගත දත්ත පද්ධතියේ හැඳුනුම්පත් අංකය නිවැරදි නොවීම.




*රූපය 03.1:Revision පද්ධතියේ විශ්‍රාම වැටුප් පරිවර්තනයට පිවිසීම*

**02.** අංක 2 මගින් දක්වා ඇති ආකාරයට "View more" බටනය මත click කර විශ්‍රාමිකයාගේ පෞද්ගලික තොරතුරු සඳහන් පිටුව වෙත පිවිසෙන්න.

## 04. පද්ධතියේ විශ්‍රාමිකයාගේ පෞද්ගලික තොරතුරු ප්‍රදාන පත්‍රයට අනුව පරීක්ෂා කර නිවැරදි කිරීම.




*රූපය 04 : Revision පද්ධතියේ විශ්‍රාමිකයාගේ පෞද්ගලික තොරතුරු පරීක්ෂා කිරීම.*

**01.** විශ්‍රාමිකයාගේ Title හා ස්ත්‍රී / පුරුෂභාවය නිවැරදිව තෝරන්න.

**02.** විශ්‍රාම වැටුප් පරිවර්තනය පිළිබඳ තොරතුරු විශ්‍රාමිකයාට ජංගම දුරකථනය හරහා කෙටි පණිවුඩයක් මඟින් දැන ගැනීමට හැකියාව සලසා ඇති බැවින් විශ්‍රාමිකයාගේ ජංගම දුරකථන අංකය යාවත්කාලීන කිරීමට කටයුතු කරන්න.

**03.** විශ්‍රාමිකයාගේ තනතුර නිවැරදිව තෝරන්න.

**04.** විශ්‍රාමිකයාගේ සේවාව නිවැරදිව තෝරන්න.


**05.** හැකිතාක් නිවැරදිව විශ්‍රාමිකයාගේ සම්පූර්ණ නම ඇතුලත් කිරීමට කටයුතු කරන්න.

උදා : දැනට පවතින නම MR K F S Gunasekara නිවැරදි කළ පසු සම්පූර්ණ නම Karunarathan Fonseka Saman Gunasekara

➢ මෙහි Highlight වී ඇති තොරතුරු පමණක් මෙහිදී වෙනස් කිරීමට නොහැක. විශ්‍රාමිකයාගේ පෞද්ගලික තොරතුරු වල නිරවද්‍යතාවය පරීක්ෂා කල පසු **Next** බටනය Click කර ඉදිරියට යන්න.

## 05.විශ්‍රාම වැටුප් පරිවර්තනය කිරීමේ තොරතුරු ඇතුලත් කිරීම.

විශ්‍රාමිකයාගේ වැටුප් පරිවර්තනයට අදාල තොරතුරු මෙම පිටුවෙහි ඇතුලත් කරන්න.




*රූපය 05 : Revision පද්ධතියේ විශ්‍රාමිකයාගේ වර්තමාන සහ පරිවර්තිත විශ්‍රාම තොරතුරු පරීක්ෂා කිරීම.*

**01.** වැටුප් පරිවර්තනය සඳහා ඇතුලත් කළ හැක්කේ 2015 වර්ෂයේදී අංක 6/2006,6/2006(iv) වැටුප් චක්‍රලේඛ අනුව ගලපන ලද විශ්‍රාම වැටුප් හා අංක 6/2006 චක්‍රලේඛය යටතේ වැටුප් ලබමින් සිට විශ්‍රාම ගිය නිලධාරීන්ගේ වැටුප් පමණි.

- ඒ අනුව විශ්‍රාම වැටුප් ප්‍රදානයට අනුව අදාල විශ්‍රාමිකයා අංක 6/2006 වැටුප් චක්‍රලේඛය යටතේ විශ්‍රාම ගිය පුද්ගලයෙකු සේ සලකා තොරතුරු ඇතුලත් කළ යුතුය.මේ සඳහා 2015 වසරේ ක්‍රියාත්මක කරන ලද වැටුප් පරිවර්තනයේ විස්තර භාවිතා කළ හැකිය.

- 2015 වසරේ සිදු කළ විශ්‍රාම වැටුප් පරිවර්තනයේදී යම් ලෙසකින් අදාල පරිවර්තනය සිදු කර නොමැති නම් (6/2006 ට විශ්‍රාම වැටුප ගැලපීමේදී විශ්‍රාම වැටුප දීමනා සමඟ ගෙවූ විශ්‍රාම වැටුපට වඩා අඩුවන විශ්‍රාමිකයන්) 2018 වසරේ සිදු කළ විශ්‍රාම වැටුප් පරිවර්තනයේදී අදාල විශ්‍රාම වැටුප චක්‍රලේඛ අංක 6/2006 ට ගලපා එම තොරතුරු පද්ධතියට ඇතුලත් කළ යුතුවේ.

**02.** විශ්‍රාම ගැන්වීම සිදු කරනු ලබන වගන්තිය, වැටුප් කේතය, ශ්‍රේණිය නිවැරදිව තෝරන්න.

**03.** විශ්‍රාම ගැන් වූ දිනය, වැටුප් වර්ධක හිමි අහිමි බව, අවසන් වැටුප් වර්ධක දිනය, සේවා කාලය, වැටුප් රහිත නිවාඩු යන තොරතුරු ද නිවැරදිව පද්ධතියට ඇතුලත් කළ යුතුය.

- වැටුප් රහිත නිවාඩු ඇතුලත් කිරීමේදී විශ්‍රාම වැටුප් ගණනයට යොදා ගන්නා වැටුප් රහිත නිවාඩු කාලය පමණක්(අනුමත වර්ෂයක කාල සීමාව හැර)ඇතුලත් කළ යුතුය.

**04.** විශ්‍රාම වැටුප් සහිත දීමනා **- Pensionable Allowances**

- විශ්‍රාම වැටුප් ගණනයේදී සැලකිල්ලට ගැනෙන දීමනා වෙනමම "Pensionable Allowances"යටතේ දැක්විය යුතුය.

**05.** විශ්‍රාම වැටුප් ගණනයට නොගැනෙන වෙනත් දීමනා **- Non Pensionable Allowances**


- විශ්‍රාම වැටුප් ගණනයට නොගැනෙන වෙනත් දීමනා වේ නම් ඒවා "Non- Pensionable Allowances" යටතේ(මාසිකව ගෙවන මුදල) දැක්විය යුතුය.

- 6/2006 වැටුප් ක්‍රමයට අදාල නිවැරදි තොරතුරු ඇතුලත් කිරීමෙන් අනතුරුව එහි පහලින් කොළ පැහැයෙන් දක්වා ඇති "CALCULATE" බටනය මත Click කරන්න. එවිට **පරිවර්තිත විශ්‍රාම තොරතුරු (Revised Pension Details)** විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය මගින් ඔබට ස්වයංක්‍රීයව ලබා දෙනු ඇත.


උදා:-

ජා.හැ.අංක 356601390X  M.සෙල්වරත්නම් මහත්මිය වසර 25 ඉංජිනේරු සේවයේ සේවය කර II වන පන්තියේ නිලධාරියක ලෙස 1981-04-10 දින විශ්‍රාම ගොස් ඇත. විශ්‍රාම යන විට ඇයගේ වැටුප් තලය 97500-15*2700-138000/T-5-1-2 වේ.2015 සිදු කරන විශ්‍රාම වැටුප් සංශෝධනයේදී ඇයගේ වැටුප PR-1-19 වගුවට අනුව ගලපා ඇත. PR-1-19 වගුව මඟින් නිරූපණය කරන වැටුප් තලය වන්නේ SL 1 තුන්වන ශ්‍රේණිය වේ. එම නිලධාරිනියට 6/2006 යටතේ අනුරූප වැටුප වනුයේ 28095 වේ. ඒ අනුව පහත පරිදි මෙම තොරතුරු පද්ධතියට ඇතුලත් කල යුතුය.

- Circular-6/2006
- Scale-SL-1
- Grade- grade III
- Monthly Salary-28095
- Date of Retired-10-04-1981
- Date of increment-10-04-1981
- Service Period- 0 days 0 months 25 years
- No Pay- 0 days 0 months 0 years




තොරතුරු ඇතුලත් කිරීමෙන් පසු Calculate ඔබන්න.එවිට ගණනය කරන ලද විශ්‍රාම වැටුප් තොරතුරු තිරයේ පහල පහත අයුරින් දිස් වනු ඇත.




රා.පරි. චක්‍රලේඛ අංක 6/2006 යටතේ හඳුන්වා දුන් වැටුප් ව්‍යුහයන් යටතේ විශ්‍රාම ගිය නිලධාරින්ගේ වැටුප් විස්තර සෘජුව පද්ධතියට ඇතුලත් කිරීමෙන් ඉහත ආකාරයටම අදාල වැටුප් පරිවර්තනය සිදු කල හැක.

- එම තොරතුරු පරීක්ෂා කර බලා නිවැරදි නම් “**Submit**” බටනය ඔබන්න.එවිට පහත පරිදි “Source document” එකක් මුද්‍රණය කර ගත හැකි වේ.



PD6 Revision

Dashboard

PD6 Revision

Department of Pension
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்

Reference Number : 23

2019 SALARY REVISION

**Pensioner Details**

| | | | |
|---|---|---|---|
| Full Name | Mrs . P PARAMESWARAM | NIC | 477341934v |
| Gender | Female | Date of Birth | 1947-08-21 |
| Permanent Address | NO 16 /B 3/ 3 SIPAT PEDESA COLOMBO 4 | Mobile Number | 94773454773 |
| Land line Number | 0114871039 | Grama Niladhari Area | Nithalawa |
| Designation | Technician | Service | Other |

**6/2006 Salary particulars**

| | | | |
|---|---|---|---|
| Scale | mn-3 | Grade | grade-I |
| Monthly Salary | 23925 | Section | |
| Date of retired | 1978-07-08 | Date of increment | 1978-07-08 |
| Service period | Days : 0 Months : 0 Years : 25 | No-pay Leaves | Days : 0 Months : 0 Years |

Allowances
Pensionable
Non-Pensionable

**Calculation details**

| Existing pension | Pension as per 6/2006 | Pension after revision |
|---|---|---|
| Pension : 18661.5 | Reduced Percentage : 68 % | Reduced Percentage : 68 % |
| Allowances : 7025 | Unreduced Percentage : 78 % | Unreduced Percentage : 78 % |
| Total Pension : 25686.5 | Reduced Pension : 16269 | Reduced Pension : 23176.44 |
| | Unreduced Pension : 18661.5 | Unreduced Pension : 26584.74 |

| | | |
|---|---|---|
| Total pensionable Allowances : 0 | Total non-pensionable Allowances : | Real Salary increase : 0 |
| | | Total pension to be paid after revision : 30109.74 |

| Prepared by | Checked by | Recommended by | Approved b |
|---|---|---|---|
| Pension officer | | | Accountan |
| 2019-05-10 | 2019-05-10 | 2019-05-10 | 2019-05-10 |

Collapse Sidebar


- අනතුරුව මුද්‍රිත පරිවර්තන අයදුම්පතහි තොරතුරු නිවැරදි බවට පරීක්ෂා කර අනුමැතිය සඳහා නිර්දේශ කර අදාල අධීක්ෂණ නිලධාරීන් වෙත අනුමැතියට යොමු කරන්න.

## 06.B ඛණ්ඩයේ නිලධාරින් සඳහා පද්ධතිය භාවිතයට උපදෙස්:

1. අංක 01 හි දැක්වෙන ආකාරයට පරිශීලක ගිණුමක් සාදා ගැනීමෙන් පසු අංක 02 ආකාරයට පද්ධතිය තුලට පිවිසීමේ පහසුකම් සලසා ඇත.


2. පද්ධතියට පිවිසීමෙන් පසු Revision යනුවෙන් දැක්වෙන මෙනුව තෝරා ගත් විට Revision දත්ත පද්ධතියට පිවිසෙයි.

.





*රූපය 06.1: B ඛණ්ඩයේ නිලධාරින් සඳහා Revision පද්ධතියේ මුල් පිටුව*

- එහි Pending ලෙස දක්වා ඇති කොටුව තෝරා ගත් විට ඔබගේ කාර්යාලයේ නිලධාරීන් විසින් සකස් කරන ලද විශ්‍රාම වැටුප් පරිවර්තන ඔබ වෙත පහත අයුරින් තිරයේ දිස් වනු ඇත.




*රූපය 06.2: නිලධාරීන් විසින් සකස් කරන ලද විශ්‍රාම වැටුප් පරිවර්තන අයදුම්පත් ලයිස්තුව*

1. පද්ධතියේ හැඳුනුම්පත් අංකය යෙදීමට ඇති කොටසේ හැඳුනුම්පත් අංකය යොදා Search කරන්න. නියමිත හැඳුනුම්පත් අංකයට අදාල අයදුම්පත එවිට ඔබට තිරයේ දිස්වනු ඇත.
2. එය තෝරා ගත් විට පද්ධතියේ ඇතුලත් කර ඇති විස්තර පහත පරිදි තිරයේ දිස්වනු ඇත.




Department of Pension
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்

Reference Number : 23

2019 SALARY REVISION

**Pensioner Details**

| | | | |
|---|---|---|---|
| Full Name | Mrs . P PARAMESWARAM | NIC | 477341934v |
| Gender | Female | Date of Birth | 1947-08-21 |
| Permanent Address | NO 16 /B 3/ 3 SIPAT PEDESA COLOMBO 4 | Mobile Number | 94773454773 |
| Land line Number | 0114871039 | Grama Niladhari Area | Nithalawa |
| Designation | Technician | Service | Other |

**6/2006 Salary particulars**

| | | | |
|---|---|---|---|
| Scale | mn-3 | Grade | grade-I |
| Monthly Salary | 23925 | Section | |
| Date of retired | 1978-07-08 | Date of increment | 1978-07-08 |
| Service period | Days : 0 Months : 0 Years : 25 | No-pay Leaves | Days : 0 Months : 0 Years : 0 |

Allowances
Pensionable
Non-Pensionable

**Calculation details**

| Existing pension | Pension as per 6/2006 | Pension after revision |
|---|---|---|
| Pension : 18661.5 | Reduced Percentage : 68 % | Reduced Percentage : 68 % |
| Allowances : 7025 | Unreduced Percentage : 78 % | Unreduced Percentage : 78 % |
| Total Pension : 25686.5 | Reduced Pension : 16269 | Reduced Pension : 23176.44 |
| | Unreduced Pension : 18661.5 | Unreduced Pension : 26584.74 |

| | | |
|---|---|---|
| Total pensionable Allowances : 0 | Total non-pensionable Allowances : | Real Salary increase : 0 |
| | | Total pension to be paid after revision : 30109.74 |

| Prepared by | Checked by | Recommended by | Approved by |
|---|---|---|---|
| Pension officer | | | Accountant |
| 2019-05-10 | 2019-05-10 | 2019-05-10 | 2019-05-10 |


*රූපය 06.3 හැඳුනුම්පත් අංකයට අදාල අයදුම්පත් විස්තරය*

- එහිදී ඔබ වෙත ලැබී ඇති Source document එක පරීක්ෂා කර අනුමත කිරීමට හෝ නැවත සකස් කර ඉදිරිපත් කරන ලෙස දැන්වීමට පහත පරිදි කටයුතු කල හැක.

- එම විස්තර දක්වා ඇති තිරයේ ඉහළ **Reject** හා **Approve** යනුවෙන් Button 2 ක් දිස්වනු ඇත.


3. අදාල අයදුම්පත අනුමත කරන්නේ නම් **Approve** තෝරා ගන්න.

**4.** එවිට ඔබට එම අයදුම්පත අනුමත වූ බවට පණිවුඩයක් තිරයේ පහත පරිදි දිස්වනු ඇත.




*රූපය 06.4: එම අයදුම්පත අනුමත වූ බවට දිස්වන පණිවිඩය*


**5.** අදාල අයදුම්පත Reject කරන්නේ නම් **Reject** තෝරාගන්න. එවිට ඒසේ කිරීමට හේතුව ඇතුලත් කිරීමට text field එකක් තිරයේ දිස්වනු ඇත.




*රූපය 06.5: හේතුව ඇතුලත් කිරීමට තිරයේ දිස්වන text field එක*

- එයට Reject කිරීමට හේතුව ඇතුලත් කර Ok තෝරා ගත් විට අයදුම්පත පද්ධතියේ Reject වී නැවත A කණ්ඩයේ නිලධාරීන් වෙත නිවැරදි කිරීම සඳහා යොමු වනු ඇත.

**6.** එවිට ඔබට එම අයදුම්පත **Reject** වූ බවට පණිවුඩයක් තිරයේ පහත පරිදි දිස්වනු ඇත.




*රූපය 06.6: හේතුව අයදුම්පත Reject වූ බවට දිස්වන පණිවිඩය*

පද්ධතිය භාවිතය පිළිබඳ ගැටලු මතු වේ නම් පහත දුරකථන අංක මඟින් සහය ලබා ගත හැක.

- තොරතුරු තාක්ෂණ අංශය - 0115920403
- සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) - 0718349022

## 06.විශ්‍රාම වැටුප් පරිවර්තනයට ඇතුලත් කල තොරතුරු යාවත්කාලීන කිරීම.

- පරිවර්තන අයදුම්පත ඇතුලත් කර මාණ්ඩලික නිලධාරියා අනුමත කර නොමැති නම් හෝ මාණ්ඩලික නිලධාරියා පරික්ෂා කර ප්‍රතික්ෂේප කර නැවත පරිවර්තනයට ඉදිරිපත් කර ඇති අයදුම්පත් A කාණ්ඩයේ නිලධාරින්ට යාවත්කාලීන කිරීමට පුළුවන.එහිදී විශ්‍රාමිකයාගේ හැඳුනුම්පත් අංකය පද්ධතියේ පෙර ලෙසම සටහන් කළ විට ඇතුලත් කර ඇති දත්ත පෙන්වන අතර නිවැරදි කිරීමෙන් අනතුරුව නැවත Source document මුද්‍රනය කළ හැක.

- මාණ්ඩලික නිලධාරියෙකු විසින් අනුමත කරන ලද අයදුම්පතක් පද්ධතිය තුළ යාවත්කාලීන කිරීමට අවස්ථාවක් නොමැති බවද කාරුණිකව සලකන්න.

- එසේම තම ප්‍රා.ලේ. කාර්යාලයට අයත් නොවන විශ්‍රාම වැටුප් පරිවර්තනයට පද්ධතිය තුල අවකාශ නොමැත.